## වැව්ලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය

# ශ්‍රී ලංකා රාජ්‍ය වැව්ලි සංස්ථාව

# මහනුවර හා මාතලේ දිස්ත්‍රික්කවල පිහිටි ශ්‍රී ලංකා රාජ්‍ය වැව්ලි සංස්ථාව යටතේ පාලනය වන වතුයායන්වල මැනුම් කටයුතු සිදු කළ ඉඩම් වල මායිම් කණු සිටුවීම සඳහා මිල ගණන් කැඳවීම.

මහනුවර හා මාතලේ දිස්ත්‍රික්කවල පිහිටි ශ්‍රී ලංකා රාජ්‍ය වැව්ලි සංස්ථාව යටතේ පාලනය වන වතුයායන්වල මැනුම් කටයුතු සිදු කල ඉඩම්වල මායිම් කණු සිටුවීම සඳහා මිල ගණන් කැඳවනු ලැබේ. එය පහත සඳහන් ආකාරයට සිදු කළ යුතුය.

- කණු එකිනෙකට මීටර් 40 ක දුරින් ස්ථාපිත කළ යුතුය
- මායිම් පැහැදිලිව හදුනාගත නොහැකි ස්ථාන වල මෙම දුර අඩු කර කණු ස්ථාපනය කල යුතුය
- පොලව මතුපිටින් ඉහලට උස සෙන්ටිමීටර 60 ක් සහ පොළොව තුළ සෙන්ටිමීටර 40 ක් වන ලෙස කණු සිටුවිය යුතුය .
- කණුවේ හැඩය හතරැස් වන අතර, මුළු උස සෙන්ටිමීටර 100 සහ විෂ්කම්භය සෙන්ටිමීටර 12.7 ක් වේ.
- වලක ගැඹුර සෙන්ටිමීටර 45 සහ වලක පළල සෙන්ටිමීටර 18 විය යුතුය
- වලක පතුලේ සෙන්ටිමීටර 5 ක කොන්ක්‍රීට් පදනමක් යෙදිය යුතු අතර කණුව තබා කොන්ක්‍රීට් යොදා කණුව ස්ථාපනය කල යුතුය.(1 : 2: 4 ලෙස සිමෙන්ති: වැලි: ගල් මිශ්‍රණය යෙදිය යුතුය )
- දැනට වත්තේ කණු පවතින ස්ථානයේ සිට අදාළ ස්ථානය වෙත රැගෙන ගොස් ස්ථාපනය කිරීම කළ යුතුය.

මෙම **කටයුත්ත** කිරීමට කැමැත්තක් දක්වන අයදුම්කරුවන්ට මිල ගණන් ඉදිරිපත් කළ හැකි අතර, මිල ගණන් ඉදිරිපත් කිරීම සඳහා වූ පෝරම ඇතුළත් ටෙන්ඩර් ලියවිලි ශ්‍රී ලංකා රාජ්‍ය වැව්ලි සංස්ථාවේ ප්‍රධාන කාර්යාලයෙන් **2026.05.25 දින සිට 2026.06.09** වන දින **පෙරවරු 9.00 සිට පස්වරු 4.00** දක්වා මිල දී ගත හැක. එම ටෙන්ඩර් ලියවිලි 2026.06.10 වන දින පස්වරු 2.00 ට පෙර ලියාපදිංචි තැපැල මඟින් එවීම හෝ ශ්‍රී ලංකා රාජ්‍ය වැව්ලි සංස්ථාවේ ප්‍රධාන කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීම සිදු කල යුතුය. මිල ගණන් ඉදිරිපත් කරන ලිපි කවරයේ වම් පස ඉහළ කෙලවරේ **"ශ්‍රී ලංකා රාජ්‍ය වැව්ලි සංස්ථාවේ මහනුවර හා මාතලේ දිස්ත්‍රික්කවල පිහිටි වතුයායන්වල මායිම් කණු සිටුවීම සඳහා මිල ගණන් කැඳවීම."** යනුවෙන් පැහැදිලිව සඳහන් කළ යුතුය.

2026.06.10 වන දින පස්වරු 2.00 ට මිල ගණන් භාර ගැනීම අවසන් වන අතර මිල ගණන් භාර ගැනීම අවසන් වූ වහාම ටෙන්ඩර් විවෘත කිරීමේ කමිටුව ඉදිරියේ මිල ගණන් විවෘත කරනු ලබන අතර එම අවස්ථාවට ඔබට හෝ ඔබගේ නියෝජිතවරයෙකුට සහභාගී විය හැක. එමෙන්ම ප්‍රමාද වී ලැබෙන මිල ගණන් පිළිබඳව සංස්ථාව වගකියනු නොලැබේ.

යම්කිසි මිල ගණනක් හෝ මිල ගණනකින් කොටසක් පිළිගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ හෝ අවලංගු කිරීමේ බලය ශ්‍රී ලංකා රාජ්‍ය වැව්ලි සංස්ථාවේ ප්‍රසම්පාදන මණ්ඩලය සතු වන අතර, එය අවසාන තීරණය ද වේ.

**සභාපති, ප්‍රසම්පාදන මණ්ඩලය,**
**ශ්‍රී ලංකා රාජ්‍ය වැව්ලි සංස්ථාව,**
**අංක 257, සිරිධම්ම මාවත, කොළඹ 10.**

**විමසීම් - 011-4194879**

**දිනය - 2026/05/25**